සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved



වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

**තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023**
**Third Term Test - Grade 12 - 2023**

# සිංහල - I

කාලය පැය 03 යි
අමතර කියවීම් කාලය වි. 10යි.

- **පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.**

---

- පහත දැක්වෙන උද්ධෘත අතුරෙන් හතරක් තෝරා ගෙන ඒ ඇසුරෙන් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදාගන්න.

(01) (අ) හඳනා සිවුර රත් කොට ගෙන ත්‍රිමණ්ඩලපටිච්ඡාදන වසයෙන් පෙකණියත් දෙදණමඬුලුත් වසා පුන්සඳමඬලෙන් භාගයක් රත්වලායෙකින් වසන කලක් පරිද්දෙන් වැළඳ ගෙන ඊ මත්තෙහි පබළු සමූහයක් රන්පමුවකින් වෙළන කලක් පරිද්දෙන් විදුලියක් හා සමාන වූ පටීධාතුන් වහන්සේ බැඳගෙන ඉක්බිති නුගපක් සමූහයක් වැනි වූ දෝ හෝ නොහොත් බඳුවදමල් ඇතිරියක් වැනි වූ සුගත් පොරෝනා සිවුර රත්පලසකින් ඇත් කුඹක් වසන්නාක් හු මෙන් ද නොහාත් සියක් රියන් උස ඇති අන් ඇගයක් පබළු දැලකින් වසන්නාක්හු මෙන් ද නොහොත් රන්දාගබක් රන්පලසකින් පිළි හස්සේ ලන කලක් මෙන් ද නොහොත් යන පුන්සඳ රත්වලායෙකින් වසන්නාක් හු මෙන් ද නොහොත් රන් පර්වත මුඳුනෙකින් පර්වතය වසා ලා රස වගුරුවන්නාක් මෙන් ද නොහොත් සිතුකුළුපව්ව බඳුවද මල් දමින් වෙළන කලක් මෙන් ද සකසා වැළඳ ගෙන .............

(i) මෙම උධෘත කොටසින් ප්‍රකාශ වෙන අවස්ථාව කුමක් ද?

(ii) පුන්සඳ මඬල රතු වලාකුළකින් වසන කලක් සේ යන උපමාවෙන් දැක්වූයේ කවර අවස්ථාවක් ද?

(iii) ''ත්‍රිමණ්ඩලපටිච්ඡාදන වශයෙන්''.... මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) ''රන් පමුවකින්'' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

(ආ) එකල ස්වාමිදරුවෝ ඔවුන් ආ කාරණා විචාරා මහණ වන්නට ආ බව අසා අවසර දුන් සේක. එකල රජ දරුවෝ සඳෙන කියන්නා හු ''ස්වාමීනි අපගේ කුලෙහි ශාක්‍යයෝ නම් ඉතා මානීයහ. මානයෙන් ම මඬනා ලදහ. නුඹ වහන්සේ වැනියන් පවා නොවඳුම්හයි මන් කළ කුලයෙක උපනුම්හ. අප ද මහණ වූ කල එබඳු වූ මානයෙක් උපනී නම් එකල මහණ ධම් මුඳුන් පැමිණිය නොදෙයි. මේ අපගේ උපාලි නම් කපුවාණන් පළමුව මහණ කොට, අප පසුව මහණ කොට වදාළ මැනව. එසේ කල ඔවුන් අපි වඳුම්හ; පුදම්හ; සත්කාර කරම්හ; එසේ කල අපගේ අභිමානත් සිඳෙයි; මහණධම් මුඳුන් පැමිණෙයි. ඉදින් මතු රාජ්‍යශ්‍රීයෙහි ලෝභයකුදු වී නම්, තොපගේ කපුවාණන් වැඳපුදා නීචක්‍රියා කොට නැවත රාජ්‍ය කරන්නට අවුදැයි ශාක්‍යයන් අපට පරිභව බෙණෙති'යි කියා ''දෙවනුව රාජ්‍ය ලෝභය ද දුරුවෙයි; මේ මේ කාරණයෙන් උන් පළමු කොට මහණ කරවා, අප පසුව මහණ කළ මැනවැ'යි කීහ. ඥානවන්තයන් සිතුවමනා සිතුවිල්ලෙක් මය.

(i) රජදරුවන් බුදුහිමියන් හමුවීමට පැමිණියේ ඇයි ?

(ii) උපාලි කපුවානන් පළමුව මහණ කළ පසු රජු දරුවන් ඔහු වෙනුවෙන් කුමක් කරන බව දක්වයි ද?

(iii) ''මන් කළ කුලයක උපනුම් හ'' යන්න ලිහිල් බසින් ලියන්න.

(iv) ''කපුවා'' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04යි)

(ඇ) මේ ජාතකය වනා හි දූරේ නිදානයෙහි පටන් කිය යුතු ය. මේ දූරේ නිදාන කථාව දීපංකර පාදමූල නිදානයෙහි පටන් සමතිස් පෙරුම් පුරා කෙළවර පාරමිතාධර්ම නැමැති ඔටුන්නෙහි අග්‍ර මාණික්‍යයක් බඳු වූ වෙස්සන්තර ජාතකයෙහි පුත්‍රදාරදීන් පරිත්‍යාගයෙන් සත් වරෙක මහ පොළොව ගුගුරුවා දෙවැනි අත්බැව්හි තුසී පුරයෙහි ඉපද සත්පනස් කෙළ සැට ලක්ෂයක් අවුරුදු දෙවියන් ට ධර්ම දේශනා කොට දස දහස් ලෝක ධාතුයෙහි දෙව් බඹුන්ගේ අයජමෙන් මහ පස් බැලුම් බලා මව්කුස පිළිසිඳ ගත් බව ද ලුම්බිණි වනෝද්‍යානයෙහි මහා බ්‍රහ්මයා අතට බිහි ව වැඩිවිය පැමිණි සියලු ලෝක ධාතුයෙහි අසදෘශාභිශේක ප්‍රාප්ත ව උයන් කෙළියට යන සඳ දෙවියන් මවා ලූ ජීර්ණ ව්‍යාධි මෘත යන තුන් පූර්ව නිමිත්ත දැක මහණ වීමෙහි උත්සහ ඇති ව මහබික්මන් කළ බව ද ........

(i) සමතිස් පෙරුම්දම් පිරීම සමාරම්භ කළේ කවර කාලයක සිට ද?

(ii) තුසී පුරයෙහි උපත ලබන කල් හි සිදු වූ ආශ්චර්යය කුමක් ද?

(iii) ''සියලු ලෝක ධාතුයෙහි අසදෘශාභිශේක ප්‍රාප්තව'' මෙය ලිහිල් බසින් ලියන්න.

(iv) ''තුන් පූර්ව නිමිත්ත'' යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

(ඈ) එකල්හි ඔහු පිටිපස හුන්නා වූ ස්වර්ණතිලකා තොමෝ නුවන් කෙළවරින් දෘෂ්ටිය හෙළා ස්වකීය වූ ස්ත්‍රී ලීලාවෙන් යුක්තව මඳලස බැල්මකින් රජහු මුහුණ බලා තමා පෙරව හුන් පලස මඳක් පහ කොට ශරීර ප්‍රභා දක්වාලූව. රජ්ජුරුවෝ ඇගේ ශරීරාලෝක හා රූප සම්පත්තිය දැක කාමයෙන් විසඥ ව සිහි මුළා ව මඳ ඇසිල්ලකින් ලබන ලද ආස්වාද ඇති ව ''මෝ තොමෝ සස්වාමික ද අස්වාමික දැ'යි විචාරා'' අස්වාමික ය. එතකුදු වූවත් සැඩොල් දූවක් ''යනුවෙන් අසා අනුන් බණන නින්දා බසට භයින් ස්වර්ණතිලකාව අන්තඃපුරයට ගත නොහී මෙබඳු වූ වර්ණ සෞන්දර්යයක් හා රූප සම්පත්තියකින් යුක්ත වූ ස්ත්‍රී රත්නයක් නො ලබන්නා වූ මට ජීවිතයෙන් ප්‍රයෝජන කිම් දැයි ශෝකාතුර ව නොයෙක් ප්‍රලාප කියා හඬමින් කාමයෙන් මත් ව කටයුතු නොකටයුතු සලකා ගත නොහී කඩුව ගෙන තමන් හිස තුමූම කපා මළහ.

(i) ස්වර්ණතිලකාව අන්තඃපුරයට ගත නොහැක්කේ ඇයි ?

(ii) රජවරුනට කළයුත්ත නොකළ යුත්ත වටහා නොගැනීමට හේතුව කුමක් ද?

(iii) ''මෙබඳු වූ වර්ණ සෞන්දර්යයන් හා රූප සම්පත්තියකින් යුත්ත'' මෙම පාඨය ලිහිල් බසින් ලියන්න.

(iv) ''විසඥව'' ..... යන්නට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

(ඉ) දිමුතු කිතු මුතු හර
කරැ දිගු පියත් පියවුර
දස රජ දම් නොහැර
එරජ රජ කරන වර එනුවර

දඹදිව් තල නොයෙක
දුරුකර පිළි ඇඳුරු සැක
සිප් සයුරු තෙර දැක
වසන සඳ අඳ දෙමව්පිය රැක

(i) කීර්තිය රූපකාර්ථ කර ඇත්තේ කුමකට ද?

(ii) ගුත්තිල පඬිවරයා වීණා ගායනයෙහි අති දක්ෂයෙක් බව ප්‍රකාශ කර ඇත්තේ කෙසේ ද?

(iii) ''කරැ දිගු පියත් පියවුර'' යන පාඨය ලිහිල් බසින් ලියන්න.

(iv) ''පිළි ඇඳුරු'' යන යෙදුමට කෙටි විවරණ සපයන්න.

(ලකුණු 04)

(උ) මිනිහා නගන කටහඬ නොම මැකෙන කනේ
ඇත මේ කුරුලු කූඩුව උස ගහක බෙනේ
නැත උවදුරක් මෙහි මෙතුවක් පහළ වුණේ
පැටවගේ කුඩා දෙනෙතට නිල් අහස පෙනේ

උණුසුම් ගතිය ඇති මුත් සිය කැදැල්ලෙහි
පැටවා කැමති නැත හිර වී විසිල්ලෙහි
දෙනෙතට නිල් අහස යොමු වන ඇසිල්ලෙහි
ඔහු යෙදෙනවා නිදහස ගැන සෙවිල්ලෙහි

මව්පිය කුරුල්ලන් රැකවරණය ඇතුව
උන්ගේ ආලයේ වෙසෙතත් ගජ මුතුව
පැටවගෙ දෙ නෙත පවතී කවදත් රතුව
සැපතක් ඔහුට නැත ඉගිලෙන්නට නැතුව

දවසට සිය විටක් මව්පිය දෙදෙන විසින්
කටටම හෙළන මුත් ආහර කුරුලු රසින්
පිට වන තුරා ඔහු සිර වී සිටන ගසින්
ඉගිලෙන සිහින පිටමං කළ නොහැක හිසින්

අරුණලු වැටෙයි පොඩි සිදුරෙන් කුරුලු ගෙට
ගී හඬ පිටත් වෙයි රුක් ලිය මුදුන සිට
කවුළුව තුළින් එළියට හිස දමන විට
හොඳ බව පෙනෙයි මෙහි ඇතුළට වැඩිය පිට

උවදුරු එමට ඇති මුත් එළිමහන　　තුරේ
පැටවට පෙනෙයි එහි පවතින කුරුලු　　පොරේ
කොපමණ කලක් ගත වේවි ද මෙහෙම　　හිරේ
සිතිවිලි නිසා ඇති නිදිබර ගතිය　　හැරේ

සටනක් නැතිව සැපතක් ඇතිවිය　　නොහැක
මේ රැකවරණ තුළ ඇති සුව　　පිරි දුකෙක
උවදුරු දිගේ යන දිග මාවත　　මිසෙක
නිදහස කරා යන වෙන පාරක්　　කිමෙක

මව්පිය කුරුල්ලන් ආහාර රැගෙන　　කමින්
ආවා පුරුදු ලෙස පැටිය දකින　　අටින්
දුටුවා හිස් ව ඇති බව ගෙය එහෙම　　සිටින්
පැටවා ගිහින් එළිවෙන කොට හතර　　වටින්　　(ලකුණු 12 යි)

(ඌ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) එසේ කළමනා කිම් ද'යි විචාළෝ ය......

(ii) ''තෙලෙ නැති පූ ම පුතණුවන්ට දෙව'යි කියා ......

(iii) ''මහරජ, යම්බඳු මැ දැන් වැන්දඹුව කෙළවර අත් බැව්හි මා කෙරෙහි ස්නේහයෙන් ක්ලේශ වශග නොවී.....'

(v) අනිත් පින්කමක් නොදනිමි. නුඹ වහන්සේ කෙරෙහි සිත් පහදවාගත් පින්කමින.....''

(vi) මට සනා ඇතියා නම් උත්තරයක් නොකියව'යි කීහ.....　　(ලකුණු 3 × 4 = 12)

02) ධර්මසේන හිමි සද්ධර්මරත්නාවලිය රචනා කිරීමේ දී''පාලි ක්‍රමය හැර අර්ථ පමණක් ගෙන අප කළා වූ ප්‍රබන්ධයෙහි .......'' යන්න දක්වා ඇත. නිර්දිෂ්ට කතා වස්තු ඇසුරින් උක්ත ප්‍රකාශය පැහැදිලි කරන්න.
(ලකුණු 15)

**නැතහොත්**

පූර්ව නිශ්චිත ආකෘතියකට අනුගතව කතා රචනාකළ අයුරු ජාතක කතා විමසීමේ දී ප්‍රකට වේ. චන්ද කින්නර ජාතකය ඇසුරින් නිර්දේශිතව පෙන්වා දෙන්න.
(ලකුණු 15)

(03) (අ) ගම්පොළ සාහිත්‍ය යුගය සිංහල සාහිත්‍ය සම්බන්ධයෙන් කෙතෙක් වැදගත් කාර්යභාරක් ඉටු කළේ ද යන්න පැහැදිලි කරන්න.　　(ලකුණු 07)

(ආ) පූජාවලී කතු හිමි කතා රචනයේ දී අනුගමනය කළ කතා රීතියේ විශේෂතා නිර්දිෂ්ට කතා ඇසුරින් ගෙනහැර දක්වන්න.　　(ලකුණු 08)

(04) ගුත්තිල කතු හිමි අවස්ථා හා සිද්ධි සජීවී අයුරින් නිරූපණය කිරීම ගුත්තිල කාව්‍යයේ විශේෂත්වයකි. පැහැදිලි කරන්න.　　(ලකුණු 15)

(05) නව කතාවක අන්තර්ගත විය යුතු මූලික ලක්ෂණ පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීමක් කර ඉන් ලක්ෂණ 03 ක් පැහැදිලි කරන්න.　　(ලකුණු 15)

(06) පැරණි සමාජයේ අන්‍යෝන්‍යව පැවති කෘතවේදීත්වය, කාරුණිකත්වය මනාව නිරූපණය කිරීමට මාර්ටින් වික්‍රමසිංහයන් වහල්ලු කෙටි කතාව උපනිශ්‍රය කරගෙන ඇත. පැහැදිලිකරන්න.　　(ලකුණු 15)

(07) කොළඹ කවියේ ද්විතීය තරංගයට අයත් නිර්මාණ ප්‍රථම තරංගයට අයත් කාව්‍ය නිර්මාණයන්ගෙන් වෙනස් වන්නේ කවර ලක්ෂණයන්ගෙන් දැයි නිදර්ශිතව පැහැදිලි කරන්න.　　(ලකුණු 15)

(08) පෙමතෝ ජායතී සොකො නාට්‍ය රචනය සඳහා ස්වර්ණතිලකා කතා වස්තුව මූලාශ්‍ර වුව ද එදිරිවීර සරච්චන්ද්‍රයන් ස්වාධීන මඟක් අනුගමනය කළ බව ප්‍රකටය. පැහැදිලි කරන්න.　　(ලකුණු 15)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved



වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023**

**Third Term Test - Grade 12 - 2023**

# සිංහල - II

කාලය පැය 03 යි

අමතර කියවීම් කාලය වි. 10යි.

- I කොටසේ පළමුවන ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

## I කොටස

- එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා, එයට හිමි අංකය වරහන් තුළ ලියන්න.

(01) (1.1) තාලුජ අක්ෂර පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ප, ඵ , බ , භ , ම (2) ය , ර , ල , ව , ශ (3) ශ , ෂ , ස , හ , ළ

(4) ඉ , ඊ , ජ , ය , ශ (5) ඍ , ඎ , ට , ඨ , ඩ (..........)

(1.2) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) නිශ්ශබ්ද, මහළු, පිළිවෙල, ආභාසය

(2) නිෂ්ශබ්ද, මහලු, පිළිවෙළ, ආභාෂය

(3) නිශ්ශබ්ද, මහලු, පිළිවෙළ, ආභාසය

(4) නිශ්ශබ්ධ, මහළු, පිළිවෙළ, ආභාෂය

(5) නිෂ්ශබ්ද , මහලු , පිළිවෙල , ආභාසය (..........)

(1.3) අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) අඹ, ජම්බු, රඹුටන්, අන්නාසි

(2) මුං, කව්පි, කඩල, පරිප්පු

(3) නාරං, දෙහි, දොඩම්, සිදරම්

(4) කරිවිල, තිබ්බටු, පතෝල, වම්බටු

(5) අල, බතල, කොස්, දෙල් (..........)

(1.4) පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) කොම්බු දෙක ''එ'' ස්වරය නියෝජක පිල්ලම් ය.

(2) කොම්බු දෙක ''ඓ'' ස්වරය නියෝජක පිල්ලම් ය.

(3) කොම්බු දෙක ''ඒ'' ස්වරය නියෝජක පිල්ලම් ය.

(4) කොම්බු දෙක ''ඖ'' ස්වරය නියෝජක පිල්ලම් ය.

(5) කොම්බු දෙක ''ඕ'' ස්වරය නියෝජක පිල්ලම් ය. (..........)

(1.5) එකිනෙකට අනුරූප වන සේ යෙදුණු වචන යුගල සහිත වරණය තෝරන්න.

(1) මන්ද මාරුතය, ප්‍රතිමා ගෘහය, හෙළබිම, කිත් යසස්

(2) විශ්‍රාම ශාලාව, අමා භෝජන, අශ්ව රථය, ආදර හැඟුම්

(3) දිය ධාරා, කිරි ආහාර, මුතු හර, අනඳ හිමි

(4) මිශ්‍ර ක්‍රියා, සිරි රහල්, ප්‍රබන්ධ කතා, වාලුකා කතර

(5) ගිනි ජාලාව, ආචර්ය මඩුල්ල, හස්ත රේඛා, පූජා භාණ්ඩ (..........)

(1.6) තත්සම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ජනාධිපති, ඇමති, මන්ත්‍රී, පුරපති

(2) වංක, සංඛ, අංක, තුංග

(3) නිවන්, පවන්, සවන්, ලවන්

(4) ශූර, වීර, ධීර, තෙර

(5) වර්ෂ, වර්ණ, දෙස, බස (..........)

(1.7) තද්භව වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) අන්ධ, මන්ද, ඉන්ද්‍ර, චන්ද්‍ර

(2) සන්ධි, සමාස, විබත්, කිරිය

(3) පළමු, දෙවැනි, සතර, පංච

(4) නන්දන, වන්දන, චන්දන, සුන්දර

(5) තුරුණු, කරුණු, කුලුණු, උනු (..........)

(1.8) විභක්ති, දකාරාර්ථ, අව්‍යය, විශේෂණ යන සමාස පද අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) මව්පිය, රතුමල, නොමනා, රන්මාලය

(2) රතුමල, මව්පිය, රන්මාලය, නොමනා

(3) රන්මාලය, මව්පිය, නොමනා, රතුමල

(4) රන්මාලය, නොමනා, රතුමල, මව්පිය

(5) රතුමල, මව්පිය, නොමනා, රන්මාලය (..........)

(1.9) කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) දුවන, පතින, නටන, ගයන

(2) රැකුම්, බැලුම්, විකුණුම්, දිනුම්

(3) ලියවිලි, මැවිලි, සැරසිලි, ඇතිලි

(4) විදෙන, ලෙළෙන, තැළෙන, වැවෙන

(5) පතළ, විසුළ, මතුළ, වගුළ (..........)

(1.10) පහත දැක්වෙන උද්ධෘතවල **<u>තද කළු අකුරෙන්</u>** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) ''මලේ රුව **බලන්** අතු අග පිපෙන කොට''

(ආ) ''**කවාලා** විලඳ ජාති ඇති කළත් රන් කුඩුවේ ගිරවා''

(ඉ) ''**තබමින්** පදතල අනුරූ''

(ඊ) ''**ගෙනේවා** සුබ වාසනා''

(1) විධික්‍රියා, පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, ආශිර්වාදක්‍රියා

(2) පූර්වක්‍රියා, විධික්‍රියා, මිශ්‍රක්‍රියා, ආශිර්වාදක්‍රියා

(3) ආශිර්වාදක්‍රියා, පූර්වක්‍රියා, විධික්‍රියා, මිශ්‍රක්‍රියා

(4) පූර්වක්‍රියා, ආශිර්වාදක්‍රියා, විධික්‍රියා, මිශ්‍රක්‍රියා

(5) විධික්‍රියා, ආශිර්වාදක්‍රියා, මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා (..........)

(1.11) තද්ධිතයක් නො වන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) පෙම්වතා, බලවතා, ධනවතා, ගුණවතා
(2) නෛතික, දෛනික, සදාතනික, වෛදික
(3) දක්ෂතා, මුදුතා, බවලතා, අවශ්‍යතා
(4) පුරාතන, නූතන, අද්‍යතන, චිරන්තන
(5) නැවියා, රැටියා, ගැමියා, හැකියා (..........)

(1.12) උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) දුමන, දුදන, දුසිල්, දුසිරිත්
(2) කුකුචි, කුපුරිස්,කුදිටු, කුමුදු
(3) අවමන්, අවවාද, අවිරෝධ, අවනීති
(4) සුපහන්, සුපිරි, සුමනා, සුවිසල්
(5) නිගරු, නිසරු, නිබොරු, නිසල (..........)

(1.13) නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) නම් , ද , කුමන , ඔව්
(2) වහා , සෙද , සඳ , කල්හි
(3) හෝ , නොහොත් , හෙවත් , වුවත්
(4) දැන් , යළි , හෙට , පිළි
(5) සමඟ , කැටුව , හා , සහ (..........)

(1.14) ''**අන්න** බලන් **සඳ රන්තැටියෙන්** සුදු සීත ගඟුල් **ගලනා**''

මෙහි වචන යෙදී ඇති අනුපිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) කෘදන්ත , නිපාත , විභක්ති
(2) නිපාත , කෘදන්ත , විභක්ති
(3) කෘදන්ත , නිපාත , විභක්ති
(4) විභක්ති , කෘදන්ත , නිපාත
(5) නිපාත , විභක්ති , කෘදන්ත (..........)

(1.15) සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය **නොකරන** ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) නැටුවා ය , ගෙතුවා ය , කළා ය , බැලුවේ ය
(2) කරයි , සොයයි , සදයි . වනයි
(3) කරත , පවසත , බලත , කියත
(4) වදාළේ ය , හදාළේ ය , කළේ ය , ගුගුළේ ය
(5) කපා , කර , කොටා , ගොස් (..........)

(1.16) සමාසයක් **නොවන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) නරසී , ගොපල් , පරපුටු , සුරරද
(2) රන්රුවන් , අඹදඹ , මව්පිය , අඹුදරු
(3) සංගීත , සන්තෝෂ , සංවාද , සංවේග
(4) අනාථ , සනාථ , අසංවර , අවස්ථා
(5) කළුපූලිය , රන්තෝඩු , නිලුපුල් , වල්ලබ (..........)

(1.17) එක ම වර්ගයට අයත් සන්ධි පද අතුළත් වරණය තෝරන්න.

(1) සුරඟන , ගුරුතුමා , මුනිඳු , පැහැති

(2) දඬුවම් , සිත්තම් , අත්තම් , පන්නම්

(3) සුරත , ගිරග , අදරැති , වමත

(4) පත්තිරු , ඇද්දළ , වල්ලූරා , වප්පිහිය

(5) පන්සාළිස් , සුවාසු , මොහොර , සමෝච්ච (..........)

(1.18) ව්‍යාකරණානුකූල ව නො ගැළපෙන වරණය තෝරන්න.

(1) ඉරහඳ , රටජාතිය , දෙස්විදෙස් , ඩෙස්පුටු

(2) වයද්දි , කඩද්දි , ගයත , සරද්දි

(3) ශ්‍රේෂ්ඨ , ජ්‍යෝෂ්ඨ , කනිෂ්ඨ , පාපිෂ්ඨ

(4) කරනු , බලනු , යදිනු , සදනු

(5) සාදර , ආදර , සපල , සබඳ (..........)

(1.19) ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍යය තෝරන්න.

(1) සුනාමි රළ පෙළ ජීවිත රැසක් බිලිගත්හ.

(2) සියලු සත්ත්වයෝ සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා !

(3) ආයතන ප්‍රධානියා සේවකයන් සමඟ සුහද ව කටයුතු කරති.

(4) මම හෝ නුඹ හෝ ඇය හෝ රැස්වීමට සහභාගී වෙමු.

(5) පියදාස අහිංසකයෙක් මෙන් ම අසරණයෙක් ද වෙයි. (..........)

(1.20) ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) රටට වෙලා තියෙන නස්පැත්තිය පේන්නැද්ද ?

(2) ඔන්න තියෙනවා අරන් පලයන්.

(3) අපේ හාමුදුරුවනේ ගෙට වැඩිය නම්.

(4) නීතිය සැමට සාධාරණ විය යුතු නොවේ ද ?

(5) වියහියදම් හරියට පොතේ ලියා ගත්ත ද ? (..........)

(ල. 1 x 20 = 20)

## II කොටස

(02) (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

මෑතක පටන් සාහිත්‍යය තාක්ෂණික පක්ෂයෙන් ඉතා සීඝ්‍ර ලෙස වර්ධනය වෙමින් පවතී. ආකෘතික අතින් සාම්ප්‍රදායික ලෙස එක දිගට ම ලියැවෙන කෘතීන්ට පාඨකයා තව දුරටත් ඒ ආකාරයට ම පිනවා ලීමට නො හැකි ව තිබේ. වාල්මීකීට, ව්‍යාසට හෝ හෝමර්ට ස්වකීය කෘති නිර්මාණයට තිබූ තරම් කාලයක් හෝ විවේකයක් අද ලේඛකයන්ට නැත. මේ නිසා ඔවුහු අනුන්ගේ දැනුමෙන් හා ශක්තියෙන් ද ප්‍රයෝජන ලැබිය යුතු අවස්ථාවකට එළඹ සිටිති. මෙහිලා අතීත දායාදය - එනම්, අතීත කෘතීන්ගෙන් ලබන ආදර්ශය හා දැනුම - පරිපූර්ණ කර ගැනීම සඳහා බැහැරියන්ගේ උපකාරය ද ලබාගත යුතු ව ඇත. එසේ බාහිර වශයෙන් උපස්ථම්භක වන එක් පිරිසකි, විචාරක පර්ෂද ය. විචාරකයෝ වනාහී නිර්මාණකරණයෙන් නොව නිර්මාණ විමර්ශනයෙන් ඒවා වැඩි දියුණු කළ හැකි ආකාරය සොයා බලන්නෝ වෙති.

ඉහත කී පරිදි රාමායණ , ජාතක කතා ආදියෙහි පොදු ආශ්වාදනීයත්වයක් ඇතත් සාමාන්‍ය ජනතාව නොදක්නා ගැඹුරක් හා අර්ථවත් භාවයක් ද ඒවායේ ඇත. ඒ ලක්ෂණය දැකිය හැක්කේ බොහෝ සාහිත්‍ය කෘති අධ්‍යයනයෙන් පරිචයක් ලද බහුශ්‍රැත බුද්ධිමතුන්ට පමණකි. ඔවුන් විසින් පෙන්වා දෙනු ලැබූ කල්හි ඒවා සාමාන්‍ය ජනයාට ද ගෝචර වේ. මෙවන් සහායක් නොලබන පාඨකයාට හුදෙක් විද්වත් ජනයා සඳහා රචිත ගැඹුරු සාහිත්‍ය කෘතීන් සදහට ම අගෝචර අවස්ථාවක පැවතීමට පුළුවන.

(i) වර්තමාන ලේඛකයා අනුන්ගේ දැනුමෙන් හා ශක්තියෙන් ප්‍රයෝජන ලැබිය යුත්තේ ඇයි?
(ii) රාමායණය , ජාතක කතා ආදියේ ගැඹුර හා අර්ථවත්භාවය දකින්නේ කවුරුන් ද?
(iii) විචාරකයෝ යනු කවරහු ද?
(iv) නූතන සාහිත්‍යය තාක්ෂණික පක්ෂයෙන් වර්ධනය වීමට හේතුව කුමක් ද?
(v) වත්මන් ලේඛකයා විචාරකයින්ගේ උපකාරය ලබාගත යුත්තේ කුමක් නිසා ද?
(vi) මෙහි සඳහන් සම්භාව්‍ය සාහිත්‍යධරයින් කවුරුන් ද? (2 x 6 = ල. 12)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සමාජය සිය කේන්ද්‍රීය ක්ෂේත්‍රය කර ගත් සමාජ විද්‍යාව පළමු ව සොයා බලන්නේ සමාජ ව්‍යුහය සෑදී ඇති ආකාරය යි. සමාජයේ සැකැස්ම සිදු වී ඇත්තේ පුද්ගලයන් කණ්ඩායම් වශයෙන් සංවිධානය වී සිටීමෙනි. පුද්ගලයා සමූහ වශයෙන් එකතු වීම , එහිදී ඔවුන් එකිනෙකා සමඟ සම්බන්ධතා පවත්වන ආකාරය ද ඒ සඳහා බලපෑ කරුණු , විශ්වාස , වටිනාකම් , සාරධර්ම , ප්‍රතිමාන ආදිය සමාජ විද්‍යාඥයාගේ මූලික අවධානයට ලක්වන කරුණු වේ. සමාජයේ වැඩි දෙනා අනුමත කරන අන්දමේ හැසිරීම් රටාවක් නොවූ විට එම හැසිරීම අසම්මත හැසිරීමක් ලෙස දක්වන සමාජ විද්‍යාව එබඳු හැසිරීම් වළක්වා සමාජයේ බහුතර කොටසකගේ අපේක්ෂාවන් හා නොගැටෙන පරිදි පුද්ගලයා සමාජය තුළ හැසිරීම පවත්වාගෙන යාම විශේෂයෙන් සොයා බලයි.

දෙවනුව සමාජ විද්‍යාව සමාජයේ ජීවත් වන මිනිසුන්ගේ සාමාජික ජීවිතය පිළිබඳ සොයා බලයි.එහි දී වඩාත් සොයා බලන්නේ සමාජයේ යම් යම් අවශ්‍යතාවන් සඳහා පුද්ගලයන් විසින් ගොඩනංවා ගෙන ඇති සමාජීය සංස්ථාවන් හෙවත් ආයත හා ඒවා සමඟ ඔවුන් පවත්වනු ලබන සම්බන්ධතා කෙරෙහි ය.

තුන්වනු ව සමාජයක දැකිය හැකි ජීවන රටාව හා සංස්කෘතික ලක්ෂණ සමඟ පුද්ගලයා කොතරම් දුරට බැඳී සිටී ද යන්න ද සමාජ විද්‍යාඥයාගේ අවධානයට ලක් වේ. ජීවන රටාව යනු පුද්ගලයා සිය ජීවිතය පවත්වා ගැනීමට දරනු ලබන උත්සාහය හා බැඳුණු ක්‍රියාකාරකම් ය. පුද්ගලයකුගේ උපතේ සිට සමාජය පිළිබඳ දැනුම්වත් වීම, තමන්ට හිමි අයිතීන් ලබා ගැනීම හා යුතුකම් ඉටු කිරීම, ආදිය එහිලා සලකා බැලේ. සංස්කෘතිය තුළින් කෙරෙන්නේ සමාජයේ පවතින වටිනාකම් පරම්පරාවෙන් පරම්පරාවට රැගෙන යාමයි. (ල.13)

(03) දී ඇති මාතෘකා වලින් එකකට අදාළ ව වචන 300-350 ට අතර වන සේ විශ්ලේෂණාත්මක රචනයක් ව්‍යාකරණානුකූලව ලියන්න.

(i) නූතන පාසල් අධ්‍යාපනයෙහි වර්තමාන රැකියා ලෝකයට ඇති යෝග්‍යතාව.

(ii) ජාතික සමගියට ආගමික අන්තවාදය තුළින් සිදු වන බලපෑම.

(iii) විදේශීය ණය ආධාර ඵලදායී ලෙස යොදා ගැනීමේ අවශ්‍යතාව

(iv) ආර්ථික සංකූලතා මානසික සමබරතාවයට කරන බලපෑම

(v) නූතන ජන මාධ්‍ය තුළ සාවද්‍ය ව්‍යවහාරය නිසා සිංහල භාෂාවට ඇති අභියෝග

(04) (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කර ලියන්න.

(i) ගායකගායිකාවන් රැසක් හෙට දින ගී ගයනු ඇත.

(ii) බලවතුන් සටන් වදිද්දී දුබලයින් බලා සිටියහ.

(iii) රණශූරයකු වූ ඔහු දක්ෂ පාලකයෙක් ද විය.

(iv) දැඩි නියඟය හමුවේ වෘක්ෂලතාවෝ මෙන් ම  සතුන් ද මරණයට පත් වූහ.

(v) ඔවුන් සතු සකල වස්තුව ගංවතුරට බිලි වූහ. (ල.05)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) පොදු ජනතාව දේශපාලකයින් විවේචනය කරති.

(ii) රජය ආධුනික ගුරුවරුන් විසිදහසක් පත් කළේ ය.

(iii) දෙමාපියෝ අප සාදරයෙන් පිළිගත්හ.

(iv) ගුරුතුමා සිසුන් ලවා පාඩම් වැඩ කරවයි.

(v) කුඩා දැරියක් පොල්තෙල් පහන දැල්වූවා ය. (ල.05)

.

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) යුක්‍රේන  ( වැසියෝ/ වැසියන්) රුසියානු (භටයින් / භටයෝ) සමඟ යුධ වැදුණහ.

(ii) (කවීන් / කවීහු) වනාහී ලෝක පාලකයෝ ( වෙති / වෙයි).

(iii) සෞඛ්‍ය (ඇමතිතුමා / ඇමතිතුමෝ) රෝගීන්ට සහන (සලසයි / සලසති).

(iv) (අපි / අප) මෙන් ම සෑම (ප්‍රාණියෙක් / ප්‍රාණියකු) ම තම දිවියට කැමති ය.

(v) (නළඟනක් / නළඟනක) ඔවුන් හමුවීමට (පැමිණියේ ය / පැමිණියා ය) (ල.05)

(05) (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරින්** දක්වා ඇති පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

(i) **සංගීත** සංදර්ශන **මෑත** කාලයේ බිහි වූ **ප්‍රාසංගික** කලාවකි.
(සංගීත - උපසර්ග , මෑත - සන්ධි , ප්‍රාසංගික - තද්ධිත)

(ii) **සුරන්** සහ **සහසැස්** - **නො** කැර සිටියේ අහස් කුස හිස්
( සුරන් - විභක්ති , සහසැස් - සමාස , නො - නිපාත )

(iii) **නූතන** කවියා නව්‍ය **කාව්‍යෝක්ති** හා ව්‍යංග්‍යාර්ථවත් **යෙදුම්** බහුල ව භාවිත කරයි.
(නූතන - තද්ධිත , කාව්‍යෝක්ති - සන්ධි , යෙදුම් - කෘදන්ත)

(iv) සැදැහැවත්හු **තෙල්මල්පහන් ගෙන** පුදබිමට **පැමිණෙත්වා** !
( තෙල්මල්පහන් - සමාස , ගෙන - ක්‍රියා , පැමිණෙත්වා - ක්‍රියා)

(v) **සැලෙන පහන්සිළු වැනි** රඟන ලිය සැදී.
(සැලෙන - කෘදන්ත , පහන් සිළු - සමාස , වැනි - නිපාත) (ල.3 × 5 =15)

(06) (අ) පහත සඳහන් වාක්‍යවල හිස් තැනට වඩාත්ම ගැළපෙන පදය වරහන් තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) සැඳෑ වලාවෝ අහසෙහි විසිතුරු .......................................... මවති.

(ii) විරුවන්ගේ ජය ඝෝෂාවෙන් යුද්ධ ....................................... කම්පිත විය.

(iii) කුමරතුඟුවෝ උපන් ................................................... වෙනුවෙන් අතිමහත් සේවාවක් ඉටු කළහ.

(iv) රෝගියා දිව්‍ය .................................................. ලදුවකු සේ ක්ෂණයකින් නැගී සිටියේ ය.

(v) සුළු වේලාවකින් ගුවන් යානය .................................................. පථයෙන් ඉවත් විය.

(vi) ජීවකයෝ සක්දෙවිඳුගේ උපකාරයෙන් දිව ............................................. දැන ගත්හ.
(බිම/ ඔසු / දර්ශන / භූමිය / ඖෂධ/ දසුන්)

(ල.½ × 6 = 03)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) දෙ + අවුරුදු (iv) ආදර + ඇති

(ii) දේශ + අනුරාගය (v) පස් + ඉඳුරන්

(iii) කොළඹ + තොට (vi) පස් + දහස

(ල.½ × 6 = 03)

(ඉ) **තද කළු අකුරින්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **දානපතියන්** විසින් **දිළිඳුන්ට** ආහාර සැපයේ.

(ii) **මහෞෂධයන්ගේ අතින්** මැණික බිම පතිත විය.

(iii) **මොනාලිසා** ඩාවින්චිගේ **තෙලිතුඩින්** නිමැවිණි.

(ල.½ × 6 = 03)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.
අහෝ ඒ වීණා වාදන මණ්ඩපය කෙතරම් අලංකාර වන්නට ඇත් ද රජවරුන් රජකුමරුවන් වියත් බමුණන් කවියන් ඇතුළු මහා ජනකායක් එහි රැස් ව සිටිය හ.

(ල. ½ × 6 = 03)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "මට තව දුරටත් මේ රටේ සිටිය නොහැකි'' යි තරුණයා කීවේ ය.

(ii) "රජතුමනි, අපට ජීවිත දානය දුන මැනවි'' යි කැරලිකරුවෝ ඉල්ලා සිටියහ.

(iii) "හෙට සියලු දෙනා ම වැඩට වාර්තා කරන්න" යි සභාපති පැවසී ය. (ල.½ × 6 = 03)

(07) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කෝට්ටේ යුගය සිංහල කවියේ ස්වර්ණමය අවධිය ලෙස සලකන්නේ විවිධ විෂයයන්ට අයත් කවිපොත් ගණනාවක් මේ යුගයේ රචනා වූ බැවිනි. ඉහත සඳහන් කළ සංදේශ කාව්‍යයන්ට අමතර ව **ගුත්තිල කාව්‍යය** , **කාව්‍යශේඛරය**, **බුදුගුණ අලංකාරය**, **ලෝවැඩ සඟරාව**, **පැරකුම්බා සිරිත**, **කව් ලකුණු මිණිමල**, ආදී කවි පොත් එකල බිහි විය. මෙයින් 'කාව්‍යශේඛරය' මහාකාව්‍යයකි. 'ගුත්තිලය' විදග්ධ කවිය හා ජනකවිය මනාව සම්මිශ්‍ර කොටගත් සිංහලයේ විශිෂ්ටතම කාව්‍යය ලෙස සැලකේ. එය **කව්සිළුමිණට** පමණක් දෙවන වන කාව්‍යයක් ලෙස උගත්තු සලකති. 'පැරකුම්බාසිරිත' සිංහලයෙන් රචිත ප්‍රථම ප්‍රශස්ති කාව්‍යය යි. 'බුදුගුණ අලංකාරය' බමුණන් දැඩි ලෙස උපහාසයට ලක් කරන විවේචනාත්මක රීතියෙන් ලියවුණු භක්ති කාව්‍යයකි. 'ලෝවැඩ සඟරාව' ථේරවාදී දහම මත පිහිටා ලෞකික ජීවිතයේ නිසරු බව විදහා පාන්නකි. ' කව්ලකුණුමිණිමල'කාව්‍ය ශාස්ත්‍රය පිළිබඳ ලියවුණකි.

(i) ඡේදයේ **තද කළු අකුරින්** මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළට සකස් කර ලියන්න.

(ii) ගුත්තිලය, සම්මිශ්‍ර , ලෞකික යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.

(iii) ඡේදයේ ඇතුළත් තද්ධිත පද තුනක් උපුටා දක්වන්න.

(iv) ඡේදයේ ඇතුළත් උපසර්ග පද සහිත පද තුනක් ලියන්න.

(v) ඡේදයෙහි ඇතුළත් ඌෂ්මාක්ෂර දෙකක් හා රකාරාංශය පිළිවෙළින් යෙදුණු වචනයක් ලියන්න.

(ල.3×5= 15)

(08) පහත දැක්වෙන මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) අන්තඃස්ථාක්ෂර

(ii) ආගම සන්ධිය

(iii) ක්‍රියා විශේෂණ

(iv) කරණකාරක කෘදන්ත

(v) තර, තම තද්ධිත ප්‍රත්‍යය

(ල. 5 × 3 = 15)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved


වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 12 - 2023

# සිංහල පිළිතුරු පත්‍රය

(01) (අ) (i) බුදුන් වහන්සේ මට්ටකුණ්ඩලී දරුවාට පිහිට වීම සඳහා වැඩම කිරීමට පෙර උන් වහන්සේ චීවරය ඉණ පටිය සහ සිවුරු ඇඳ ගත් ආකාරය වේ.

(ii) රන්වන් පැහැති සම්බුදු සිරුරට රතු පාටැති සිවුර පොරවා ගත් අවස්ථාව.

(iii) ''නාභිය (පෙකනිය) දණහිස් දෙක යන ස්ථාන තුන මනාව වසා ගැනීස ලෙස''

(iv) රනින් කරන ලද හවඩියක් / පාමංගයක්

(ලකුණු 04)

(ආ) (i) මහණ වන්නට / මහණ වීම සඳහා

(ii) වැඳීම, පිදීම හා සත්කාර කිරීම.

(iii) 'මානයෙන් යුක්ත කුලයක ඉපදුනහ / උපන්හ. / ඉපදුනෙමු.

(iv) අන්‍යයන්ගේ කෙස් රැවුල් කපන තැනැත්තා (කරණවෑමියා)

(ලකුණු 04)

(ඇ) (i) දීපංකර බුදු හිමියන්ගෙන් විවරණ ලැබූ දා සිට

(ii) සත් වතාවක් මහ පොළොව කම්පා වීම.

(iii) මුළු සක්වළෙහි අසාමාන වූ අභිෂේකයට පත් ව

(iv) පෙර නිමිති තුන එන මහළු වීම, ලෙඩ වීම, මරණයට පත් වීම.

(ඈ) (i) සැඩොල් කුල කාන්තාවක් බැවින්

(ii) ස්වර්ණතිලකාව දුටුවිට ඇතිවන කාම සිතුවිල්ලෙන් මුලාවීම නිසා

(iii) ''මෙවැනි වූ රූපයෙහි සුන්දරත්වයෙන් හා රූපය නම් සම්පත්තියෙන් (ශ්‍රියෙන්) යුතුව.

(iv) සිහිනැතිව (සංඥා නම් අරමුණු හඳුනාගත නොහැකිව)

(ලකුණු 04)

(ඉ) (i) මුතු මාලයට

(ii) දඹදිව බොහෝ වූ විරුද්ධ ආචාර්යවරුන්ගේ සැක දුරුකොට ශිල්ප සාගරයෙක් එතෙරව යන්නෙන්

(iii) දිශා නැමැති ප්‍රියාවන්ගේ පයෝධරයෙහි බහා

(iv) විරුද්ධ ආචාර්යවරුන්ගේ / ප්‍රතිපක්ෂ වූ ගුරුන්ගේ

(ලකුණු 04)

(ඊ) (i) ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්ම රත්නාවලියේ මට්ටකුණ්ඩලී කතා වස්තුවේ එන පාඨයකි. මට්ටකුණ්ඩලීට පාණ්ඩු රෝගය වැළඳී ඇති බවත් ඔහුගේ මෑණියන් (බැමිණිය) අදින්න පුබ්බක බමුණාට වෛද්‍යවරයෙකු කැඳවන්න යැයි කියූවිට වස්තුවට හානියක් වේ යැයි බමණු පවසන අවස්ථාවේ බැමිණිය විසින් බමුණාට මෙය ප්‍රකාශ කරන ලදී.

(ii) මයුර පාද පිරිවෙන්පති බුද්ධ පුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලියේ අනුරුද්ධ කුමාර කථා වස්තුවේ එන පාඨයකි. අනුරුද්ධ කුමරු නැති කැවුම් ඉල්ලා යැවූ අවස්ථාවේ අනුරුද්ධ කුමරුගේ මෑණියන් විසින් සේවයකුට (පුරුෂයෙකුට) කියූ අවස්ථාවට මෙය සම්බන්ධයි.

(iii) බහු කර්තෘ මණ්ඩලයක් විසින් රචිත පන්සියපනස් ජාතක පොතේ එන චන්නකින්නර ජාතකයෙන් උපුටා ගත්තකි. බුදුන්වහන්සේ පළමුව සුදොවුන් මාලිගයට වැඩි අවස්ථාවේ සුද්ධෝදන රජතුමා යසෝදරා දේවියගේ ගුණ කියන අවස්ථාවේ බුදුන් විසින් සුදොවුන් රජුට පැවැසූවකි.

(iv) මාර්ටින් වික්‍රමසිංහ මහතා විසින් රචිත ''වහල්ලු'' කෙටිකතාවේ පාඨයකි. උපාලිස්ගේ බිරිඳ විසින් හඳයා විකුණා දැමිය යුතු බව කියන අවස්ථාවේ උපාලිස් විසින් සිය බිරිඳට පවසන අවස්ථාවට මෙය සම්බන්ධයි.

(v) ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්මරත්නාවලියේ මට්ටකුණ්ඩලි කතා වස්තුවේ එන පාඨයකි. බුදුන්වහන්සේ අදින්නපුබ්බක බමුණාගේ මැදුරේ දී ඔවුන් සැකදුරුකරණු වස් මටට්කුණ්ඩලී දේවතාවා බුදුන්වහන්සේ අසන පැනයට මට්ටකුණ්ඩලී දේවතාවා බුදුන් වහන්සේට දෙන ලද පිළිතුරකි. දෙවන අවස්ථාවට මෙය සම්බන්දයි.

(vi) මයුරපාද පිරිවෙන්පති බුද්ධ පුත්‍ර හිමියන් විසින් රචිත පූජාවලියේ අනුරද්ධ කුමාර කතා වස්තුවේ එන පාඨයකි. අනුරුද්ධ කුමරුහට යහළුවා වූ භද්දිය රජ්ජුරුවෝ වෙත ගොස් මහණවීමට කැමැත්ත ගැනීමට පොරොන්දු කරවා ගැනීමෙන් පසු මහණ වීමට යමු යැයි කාලසීමාවන් ගැන කතා කරන අවස්ථාවේ භද්දිය රජු විසින් අනුරුද්ධකුමරුට පවසන ලදී.

(1) උ කොටස සහ අංක 02 සිට 08 දක්වා ප්‍රශ්නයට අදාළ නිදර්ශන සහිතව දක්වා තිබීම සහ ඊට අනුව විස්තර කිරීම් වලට ලකුණු පිරිනමන්න.

(01) **සිංහල - II**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (1) 4 | (2) 3 | (3) 4 | (4) 2 | (5) 1 | (6) 2 | (7) 5 |
| (8) 3 | (9) 3 | (10) 1 | (11) 3 | (12) 2 | (13) 4 | (14) 5 |
| (15) 1 | (16) 4 | (17) 1 | (18) 5 | (19) 2 | (20) 4 | |

II කොටස (ලකුණු 1 × 20 = 20)

(02) (අ) (i) නිර්මාණකරණයට ප්‍රමාණවත් කාලයක් හෝ විවේකයක් නොමැති නිසා

(ii) සාහිත්‍ය කෘති අධ්‍යයනයෙන් පරිචයක් ලද බහුශ්‍රැත බුද්ධිමතුන්

(iii) නිර්මාණ විමර්ශනය කොට ඒවා වැඩි දියුණු කළ හැකි ආකාරය සොයා බලන්නෝ ය.

(iv) ආකෘතික අතින් සාම්ප්‍රදායික ව ලියැවෙන කෘතින්ට පාඨකයා තවදුරටත් පිනවීමට නොහැකි වීම.

(v) අතීත කෘතීන්ගෙන් ලබන ආදර්ශය හා දැනුම පරිපූර්ණ කර ගැනීමට ය.

(vi) වාල්මීකී, ව්‍යාස , හෝමර්

(නම් තුන ම ඇත්නම් ලකුණු 2යි, දෙකක් ඇත්නම් ලකුණු 1 යි. එකක් නම් ලකුණු නැත.)

( ල :12)

(ආ) පහත කරුණු සාරාංශයෙහි අන්තර්ගත විය යුතුයි.

* සමාජ විද්‍යාවේ කේන්ද්‍රීය ක්ෂේත්‍රය සමාජයයි.
* සමාජ ව්‍යුහය සකස් වී ඇති ආකාරයත්, පුද්ගල සබඳතා හා ඒ සඳහා බලපෑ කරුණු මූලික ව අවධානයට ලක් වේ.
* සමාජය නො පිළිගත් අසම්මත හැසිරීම් වළකා අනුමත කළ සම්මත හැසිරීම් පුද්ගලයා පවත්වාගෙන යන අයුරු සොයා බැලීම සිදු වේ.
* පුද්ගලයින් විසින් ගොඩනංවනු ලැබූ සමාජ සංස්ථා සමඟ පුද්ගලයා පවත්වන සබඳතා පිළිබඳ විමසීම සිදු කෙරේ.
* සමාජයේ පවතින ජීවන රටාව හා සංස්කෘතිය සමග පුද්ගල සබඳතාව සමාජ විද්‍යාඥයාගේ අවධානයට ලක් වේ.

ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර ඡේදවලට බෙදා ඇත්නම් සමස්තයෙන් ලකුණු දෙකක් අඩු වේ. වචන සංඛ්‍යාව 60 - 70 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි හෝ වේ නම් වචන ප්‍රමාණයට ලකුණු 2ක් අඩු වේ.

| | |
|---|---|
| නියමිත වචන ප්‍රමාණයට | - ලකුණු 02 යි. |
| භාෂා නිරවද්‍යතාවයට | - ලකුණු 03 යි. |
| අන්තර්ගතයට | - ලකුණු 08 යි. |
| | 13 යි. |

(03) වචන සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කරන්න. වචන 400 ට වැඩි වේ නම් හෝ 250 ට අඩුවේ නම් හෝ ලකුණු 03 ක් අඩු කළ යුතු වේ. (ලකුණු 25)

(i) රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය.

(ii) එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම.

(iii) කරුණුවල පැහැදිලි බව.

(iv) නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කිරීම.

(v) ව්‍යාකරණ දෝෂ රහිත වීම.

(vi) භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම.

(vii) සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම.

(viii) කියවිය හැකි සේ අත්අකුරු පැහැදිලි වීම.

විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්ථාව පිරුළු වැනි අංග කෙරෙහි සැලකිල්ල යොමු කරන්න.ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම නොකළ යුතු ය. සමස්ථයක් ලෙස සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.

(ලකුණු - 25)

(04) (අ) (i) නිවැරදි වාක්‍යයකි.
(ii) බලවතුන් සටන් වදිද්දී දුබලයෝ බලා සිටියහ.
(iii) නිවැරදි වාක්‍යයකි.
(iv) දැඩි නියඟය හමුවේ වෘක්ෂලතාවන් මෙන්ම සත්තු ද මරණයට පත් වූහ.
(v) ඔවුන් සතු සකල වස්තුව ගංවතුරට බිලි විය. (ල. 05)

(ආ) (i) පොදු ජනතාව විසින් දේශපාලකයෝ විවේචනය කෙරෙති/ කරනු ලබති / කරනු ලැබෙති.
(ii) රජය විසින් ආධුනික ගුරුවරු විසිදහසක් පත් කෙරුණහ / කරනු ලැබූහ / කරන ලදහ / කරනු ලැබුවෝ ය / පත් කෙරුණි.
(iii) දෙමාපියන් විසින් අපි සාදරයෙන් පිළිගැනුණෙමු / පිළිගනු ලැබීමු / ලැබුවෙමු / පිළිගන්නා ලදිමු / ලද්දෙමු.
(iv) ගුරුතුමා විසින් සිසුන් ලවා පාඩම් වැඩ කරවනු ලබයි / කරවනු ලැබෙයි.
(v) කුඩා දැරියක විසින් පොල්තෙල් පහන දැල්විණි / දල්වන ලදී / දල්වනු ලැබිණි. (ල. 05)

(ඉ) (i) වැසියෝ , හටයින් (ii) කවීහු , වෙති
(iii) ඇමතිතුමා , සලසයි / ඇමතිතුමෝ , සලසති
(iv) අප , ප්‍රාණියකු (v) නළඟනක් , පැමිණියා ය (ල. 05)

(05) (i) සංගීත - උපසර්ග - අර්ථය තීව්‍ර කිරීම/ මනා යන අර්ථය
මැත - සන්ධි - ස්වරාදේශ සන්ධිය / ගුණ සන්ධිය
ප්‍රාසංගික - තද්ධිත - ඊට අයත් / ඊට සම්බන්ධ යන අර්ථය
(ii) සුරන් - විභක්ති - කර්තෘ විභක්තිය / කතු විබත
සහසැස් - සමාස - අන්‍යාර්ථ සමාස / අන් අරුත් සමස්
නො - නිපාත - විරුද්ධාර්ථයේ නිපාත / විරෝධාර්ථයේ නිපාත
(iii) නූතන - තද්ධිත - ඊට සම්බන්ධ / ඊට අයත් යන අර්ථය
කාව්‍යෝක්ති - සන්ධි - ස්වරාදේශ සන්ධිය / ගුණ සන්ධිය
යෙදුම් - කෘදන්ත - භාවකාරක කෘදන්ත
(iv) තෙල්මල්පහන් - සමාස - 'ද' කරාර්ථ සමාස / 'ද' අරුත් සමස්
ගෙන - ක්‍රියා - පූර්ව ක්‍රියා / පෙර කිරිය
පැමිණෙත්වා - ක්‍රියා - ආශිර්වාද ක්‍රියා / ආසි කිරිය
(v) සැලෙන - කෘදන්ත - වර්තමාන කර්ම කාරක කෘදන්ත
පහනිසිළු - සමාස - විභක්ති සමාස / සම්බන්ධ විභක්ති සමාස
වැනි - නිපාත - තුල්‍යාර්ථයේ නිපාත / උපමා වාචී නිපාත (½ ×6 = 03)

(06) (අ) (i) දසුන් (ii) භූමිය (iii) බිම (iv) ඖෂධ (iv) දර්ශන (vi) ඔසු (ල. 3 )

(ආ) (i) දැවුරුදු (ii) දේශානුරාගය
(iii) කොළොම්තොට (iv) අදරැති
(v) පසිඳුරන් (vi) පන්දහස (ල. 03)

(ඉ) (i) දානපතියන් - කර්තෘ විභක්තිය / කතු විබත
දිළිඳුන්ට - සම්ප්‍රදානා විභක්තිය / සපදන් විබත
(ii) මහෞෂධයන්ගේ - සම්බන්ධ විභක්තිය / සබඳ විබත
අතින් - අවධි විභක්තිය / අවධි විබත
(iii) මොනාලිසා - ප්‍රථමා විභක්තිය / පෙර විබත
තෙලිතුඩින් - කරණ විභක්තිය / කරණ විබත (½ ×6 = 03)

(ඊ) (i) අහෝ ! ඒ වීණා වාදන මණ්ඩපය කෙතරම් අලංකාර වන්නට ඇත් ද? රජවරුන්, රජකුමරුවන්, වියත් බමුණන්, කවියන් ඇතුළු මහා ජනකායක් එහි රැස් ව සිටිය හ. (½ ×6 = 03)

(උ) (i) තමාට තවදුරටත් ඒ රටේ සිටිය නොහැකි බව තරුණයා කීවේ ය.
(ii) කැරලිකරුවෝ, රජතුමා අමතා තමන්ට ජීවිත දානය දෙන ලෙස ඉල්ලා සිටියහ.
(iii) පසුදින සියලු දෙනා ම වැඩට වාර්තා කරන මෙන්/ ලෙස සභාපති පැවසී ය. (ල. = 3)

(07) (i) කව්ලකුණුමිණිමල, කව්සිළුමිණ , කාව්‍යශේඛරය , ගුත්තිල කාව්‍ය , පැරකුම්බා සිරිත , බුදුගුණ අලංකාරය , ලෝවැඩ සඟරාව

(ii) ගුත්තිලය - කෙටි පාපිල්ල , (හල්පිල්ල / කොඩිය) , කෙටි ඉස්පිල්ල
සම්මිශ්‍ර - (හල්පිල්ල / රැහැන) , කෙටි ඉස්පිල්ල රකාරාංශය
ලෞකික - කොම්බුව හා ගයනුකිත්ත , කෙටි ඉස්පිල්ල

(iii) ස්වර්ණමය , විශිෂ්ටතම , පමණක් , කාව්‍යයක් , ලෞකික

(iv) සන්දේශ , සම්මිශ්‍ර , විශිෂ්ටතම , උපහාසයට , නිසරු , පිළිබඳ

(v) ශාස්ත්‍ර (ල . 15)

(08) (i) අන්තඃස්ථාක්ෂර :
මෙම අක්ෂර ව්‍යඤ්ජනාක්ෂර වේ. උච්චාරණයේ දී ස්වර හා ව්‍යඤ්ජන යන දෙකෙහි ම ගති ස්වභාවයක් පවතින නිසා 'අන්තඃස්ථ' යන නමින් හැඳින්වේ. 'අර්ධ ස්වර' යනු ද මීට ම නමකි.
ය් , ල් , ර් , ව් යනු ඒ අක්ෂරයි.

ය් → ඉ
ර් → ඍ
ල් → ඏ
ව් → උ වශයෙන් ඒ ඒ අක්ෂර ස්වර ස්වභාවය නියෝජනය කරයි. වර්තමානයේ දී මූර්ධජ 'ළ' අක්ෂරය ද අන්තඃස්ථ ගනයට ඇතුළත් කර තිබේ.

(ii) ආගම සන්ධිය :
පද දෙකක් සන්ධි වීමේ දී පෙර පදයේ අගට යෙදෙන අක්ෂරයත්, පෙර පදයේ මුලට යෙදෙන අක්ෂරයත් අතරට අමුතුවෙන් අක්ෂරයක් පැමිණ වීමෙන් ගළපා ගන්නා සන්ධිය ආගම සන්ධිය වේ.
මෙහි දී ය් , ව් , ර් යන ව්‍යඤ්ජනාක්ෂර ආගමය වේ.
උදාහරණ :

ය් - පිරි + අත් → පිරි + ය් + අත් → පිරියත්
දෙ + ආකාර → දෙ + ය් + ආකාර → දෙයාකාර
ව් - කටු + අල → කටු + ව් + අල → කටුවල
කොලු + ආ → කොලු+ ව් + ආ → කොලුවා
ර් - පුන + උත් → පුන + ර් + උත් → පුනරුත්
- නි + අතුරු → නි + ර් + අතුරු → නිරතුරු

ස්වරාගමය වන වචන කිහිපයක් ද හමු වේ.
තුන් + රුවන් → තුන් + උ + රුවන් → තුනුරුවන්

(iii) ක්‍රියා විශේෂණ :
ක්‍රියා පදයකට විශේෂණයක් වශයෙන් යොදන පද ක්‍රියා විශේෂණ වේ. ක්‍රියා විශේෂණය ප්‍රධාන අර්ථ හතරකින් යෙදෙයි.( ක්‍රියා විශේෂණයෙහි යෙදීම් වශයෙන් තවත් ප්‍රභේද රාශියක් පවතී)

(1) ආකාරාර්ථ - ක්‍රියාව සිදු වන්නේ කෙසේ ද යනු යි.
උදාහරණ : ඔහු <u>වේගයෙන්</u> දුවයි.
ඇ <u>සෙමින්</u> ගමන් කරයි.

(2) කාලාර්ථ - ක්‍රියාව සිදු වන කාලය / අවස්ථාව ප්‍රකාශ වේ.
උදාහරණ : ළමයා <u>උදෑසන</u> පාසලට ගියේ ය.
<u>සවස 2.00 ට</u> තරගය ආරම්භ විය.

(3) ස්ථානාර්ථ - ක්‍රියාව සිදුවන ස්ථානය ප්‍රකාශ වේ.
උදාහරණ : <u>නිවසෙහි</u> කිසිවෙක් නොවී ය.
ප්‍රධාන <u>ශාලාවෙහි</u> රැස්වීම පැවැත්විණි.

(4) හේත්වර්ථ - ක්‍රියාව සිදු වීමට බලපෑ හේතුව ප්‍රකාශ වේ.
උදාහරණ : ඇ <u>සතුටින්</u> සිනාසෙයි.
සාවා <u>බියෙන්</u> වෙවුලයි.

(iv) කරණකාරක කෘදන්ත ඃ

ක්‍රියා ධාතුවකට පදසාධන ප්‍රත්‍යයක් / කෘදන්ත ප්‍රත්‍යයක් එක් වීමෙන් සෑදෙන නව නාම කෘදන්ත නාම වේ. කරණාර්ථය හෙවත් එයින් කරනුයේ යන අර්ථය සහිත කෘදන්ත නාම කරණකාරක කෘදන්ත වේ. මෙහි දී ධාතු ප්‍රකෘතියට බහුල වශයෙන් 'න' කෘදන්ත ප්‍රත්‍යය එක් වේ.

උදාහරණ ඃ

| | |
|---|---|
| එයින් දක්නේ | - (දුර ) දක්නය |
| එයින් කඩනුයේ | - කඩනය (දියකඩනය) |
| එයින් පෙරනුයේ | - පෙරනය (කිරිපෙරනය) |
| එයින් දවටනුයේ | - දවටනය |
| එයින් පොරවනුයේ | - පොරවනය |
| එය කරණ කොට රදවනුයේ | - රදවනය |
| එයින් පිසදමනුයේ | - පිසිනය (පිස්නය) |

(v) තර, තම තද්ධිත ප්‍රත්‍යයඃ

ශබ්ද ප්‍රකෘතියකට (නාම ප්‍රකෘති) පදසාධන ප්‍රත්‍යයක් / තද්ධිත ප්‍රත්‍යයක් එක් වීමෙන් සෑදෙන නව නාම තද්ධිත නාම වේ. - තර ප්‍රත්‍යය තුලනාර්ථයේ ද, - තම ප්‍රත්‍යය උත්කෘෂ්ටාර්ථයේ ද යෙදේ.

උදාහරණ ඃ

දක්ෂ - තර → දක්ෂතර (වඩා දක්ෂ)

ප්‍රිය - තර → ප්‍රියතර (වඩා ප්‍රිය)

මිහිරි - තර → මිහිරිතර (වඩා මිහිරි)

තම - ප්‍රත්‍යය - සියල්ල හෝ සියලු දෙනා අතුරෙන් උසස් යන අර්ථයයි. උත්කෘෂ්ටාර්ථයේ (වඩාත් ම උසස්) යෙදේ.

උදාහරණ ඃ

දක්ෂ - තම → දක්ෂතම (වඩාත් ම දක්ෂ)

ප්‍රිය - තම → ප්‍රියතම (වඩාත් ම ප්‍රිය)

මිහිරි - තම → මිහිරිතම (වඩාත්ම මිහිරි)

මෙන් හැඳින්වීමට ලකුණු 02යි. උදාහරණවලට ලකුණු 03 යි.

( ලකුණු 05 බැගින් මුළු ලකුණු - 15)

→